# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2468/06 - 2025 දෙසැම්බර් මස 23 වැනි අඟහරුවාදා - 2025.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත**

2025 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග

2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 17 වන වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද නියෝග.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය,

2025 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග සඳහා සංශෝධන

1. මෙම නියෝග 2025 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

2. 2024 අප්‍රේල් මස 30 දින අංක 2382/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද 2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ:-


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2.1 නියෝග 3 මෙයින් අවලංගු කෙරෙන අතර, ඒ වෙනුවට පහත දක්වා ඇති නව නියෝග ආදේශ කිරීම.

3. මෙම නියෝගයන්හි අරමුණ සඳහා, "මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවාව" යන්නෙන් මුදල්, චෙක්පත්, වෙනත් මූල්‍ය උපකරණ හෝ අනෙකුත් අගය රාශිගත උපකරණ ආකාරයෙන් මුදල් භාර ගැනීම සහ එම වටිනාකමට අනුරූප අගයක් මුදලින් හෝ නිවේදනයක්, පණිවිඩයක්, පැවරීමක් මගින් ප්‍රතිලාභියෙකුට ගෙවීම හෝ ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවා සපයන්නා අයත් වන නිෂ්කාශන ජාල ආදී වෙනත් ක්‍රමවේද මගින් ප්‍රතිලාභියෙකුට ගෙවීම් කිරීම යන මූල්‍ය සේවාවන් අදහස් වේ. එවැනි ගනුදෙනු සඳහා එක් අතරමැදියකු හෝ වැඩි ගණනක් සම්බන්ධ වෙමින් තෙවන පාර්ශවයකට සිදු කරනු ලබන අවසාන ගෙවීමක් ද ඇතුළුව,

(i) ශ්‍රී ලංකාව තුළ;
(ii) වෙනත් ඕනෑම රටක සිට ශ්‍රී ලංකාවට; හෝ
(iii) ශ්‍රී ලංකාවේ සිට වෙනත් ඕනෑම රටකට;

යනාදී වශයෙන් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට විය හැකිය.

ඉහත (ii) සහ (iii) අයිතමවල සඳහන් සේවාවන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධානවලට යටත්ව සිදු කළ යුතුය.

2.2 නියෝග 5 පහත පරිදි සංශෝධනය කරේ.

(අ) උප නියෝග 5(අ) අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් නව උප නියෝග ආදේශ කිරීමෙන්:-

5(අ) ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස ව්‍යාපාර කටයුතුවල නියුක්ත වීමට හෝ ක්‍රියා කිරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබීම සඳහා කිසියම් පුද්ගලයෙකු;

i. 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අර්ථ නිරූපණය අනුව, ඇපයෙන් සීමිත සමාගමක්, හෝ අක් වෙරළ සමාගමක් හැර, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති අවම වශයෙන් රුපියල් මිලියන පහළොවක (මිලියන 15) හෝ මහ බැංකුව විසින් නියම කරන ලද වෙනත් ප්‍රමාණයක භායනය නොවූ ප්‍රාග්ධනයක් ඇති සමාගමක් වීම, නැතහොත් ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කර ඇති, මුදල් හෝ වටිනාකම් පැවරීම් කටයුතු සිදු කිරීම සඳහා අදාළ රටේ මහ බැංකුව, රජය හෝ වෙනත් ඕනෑම නියාමන අධිකාරියක් විසින් බලපත්‍රලාභී, ලියාපදිංචි, බලයලත්, අවසර ලත්, අවම වශයෙන් එ.ජ. ඩොලර් 200,000 (එ.ජ. ඩොලර් ලක්ෂ දෙකක) හෝ වෙනත් ඕනෑම විදේශ මුදල් වර්ගයකින් ඊට අනුරූප අගයකින් භායනය නොවූ ප්‍රාග්ධනයක් ඇති සමාගමක් වීම;

ii. ශ්‍රී ලංකාව තුළ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නකුගේ ව්‍යාපාර හා කටයුතු පමණක් සිදු කිරීම; සහ

iii. මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සැපයීම සඳහා පද්ධතියක් හෝ මනාව නිර්වචනය කරන ලද යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම/ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

(ආ) උප නියෝග 5(ඇ) අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් නව උප නියෝග ආදේශ කිරීමෙන් :-

5(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති සහ මහ බැංකුව හෝ වෙනත් ඕනෑම නියාමකයෙකු හෝ රජයේ ආයතනයක් විසින් නිකුත් කරන ලද කිසිදු බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ බලය පැවරීමක් නොමැතිව ශ්‍රී ලංකාව තුළ දැනටමත් සේවා සපයන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්, 2026.03.31 දින හෝ ඊට පෙර ලියාපදිංචි සහතිකයක් සඳහා ඉල්ලුම් කළ යුතු අතර, එවැනි ලියාපදිංචි සහතිකය සඳහා වන අයදුම්පතක් නියමිත කාල සීමාව තුළ නිසි ලෙස යොමු කොට ඇති නම් ඔවුන්ගේ අයදුම්පත සම්බන්ධයෙන් මහ බැංකුව වෙතින් දැනුම් දීමක් ලැබෙන තුරු ඔවුන්ගේ ව්‍යාපාරයන්හි නිරත වීමට අවසර දෙනු ලැබේ.

2.3 උප නියෝග 7(ඇ) මෙයින් අවලංගු කෙරේ.

2.4 නියෝග 12 මෙයින් අවලංගු කෙරෙන අතර, ඒ වෙනුවට පහත දක්වා ඇති නව නියෝග ආදේශ කිරීම:-

12. මහ බැංකුව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය යටතේ ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්ගේ නියෝජිතයෙකු, දැනට පවත්නා නීතියට අනුව අදාළ විය හැකි බලපත්‍රයක, අවසරයක, බලය පැවරීමක හෝ ලියාපදිංචියක අධිකාරියකින් තොරව පහත සඳහන් කිසිදු කටයුත්තක නිරත නොවිය යුතුය.

(අ) තැන්පතු භාර ගැනීම
(ආ) විදේශ විනිමය ගනුදෙනු
(ඇ) ණය ලබා දීම
(ඈ) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත, 1988 අංක 30 දරන බැංකු පනත, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත, 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත, 1937 අංක 7 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත, 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත ඇතුළු ඕනෑම පනතක් හෝ ආඥා පනතක් හෝ ඒවායේ ඕනෑම සංශෝධනයක් හෝ ඒ අනුව නිකුත් කරන ලද නියෝගයන් යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, අවසරයක්, බලය පැවරීමක් හෝ ලියාපදිංචි කිරීමක් මගින් නියම කරනු ලබන කටයුතු
(ඉ) මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝග හෝ විධිවිධානයක් හෝ වෙනත් ඕනෑම නීතියක් මගින් සීමා කර ඇති කටයුතු.

2.5 නියෝග 13 මෙයින් අවලංගු කෙරෙන අතර, ඒ වෙනුවට පහත දක්වා ඇති නව නියෝග ආදේශ කිරීම:-

13. ඉහත නියෝග 5(අ)(i) යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්, එහි නාමයට මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන ව්‍යාපාරයක් බවට හැඟවෙන වචන හැර, බැංකුව, මූල්‍ය ආයතනය, ආයෝජන සමාගම, මුදල් හෝ විදේශ මුදල් හුවමාරුව, දේපළ වෙළඳාම වැනි වෙනත් ක්‍රියාකාරකම් හැඟවෙන හෝ වෙන යම් වචන ඇතුළත් නොකළ යුතුය.

මෙම නියෝග යටතේ වූ සීමාවන්, ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කර ඇති මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා බල නොපැවැත්වේ.

2.6 නියෝග 14 මෙයින් අවලංගු කෙරෙන අතර, ඒ වෙනුවට පහත දක්වා ඇති නව නියෝග ආදේශ කිරීම:-

14. සෑම ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකුම පහත සඳහන් ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳව රාජකාරි දින දහයක් ඇතුළත මහ බැංකුව වෙත ලිඛිතව දැනුම් දිය යුතුය:-

(අ) ලියාපදිංචි මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නාගේ නම;
(ආ) ලියාපදිංචි කාර්යාල ලිපිනය;
(ඇ) සාංගමික ව්‍යවස්ථාවලිය;
(ඈ) අධ්‍යක්ෂක මණ්ඩලයෙහි හෝ ව්‍යාපාරයේ ප්‍රධාන විධායක නිලධාරියා සම්බන්ධ පත් කිරීමක් හෝ වෙනත් වෙනස්කමක්; හෝ
(ඉ) මහ බැංකුව විසින් කලින් කලට නිර්ණය කරනු ලබන වෙනත් ඕනෑම ව්‍යුහාත්මක වෙනස්කමක්.

ව්‍යාපාරයෙහි අධ්‍යක්ෂක මණ්ඩලයෙහි හෝ ප්‍රධාන විධායක නිලධාරියා සම්බන්ධ පත් කිරීමක් හෝ වෙනත් වෙනස්කමක් ඇති වූ අවස්ථාවකදී, මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඇති අයදුම්පතේ II වන උපලේඛනයේ සඳහන් පරිදි දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය.

3. මෙම නියෝගයන් 2025 දෙසැම්බර් මස 31 වන දින සිට බලාත්මක වනු ඇත.

EOG 12 - 0216

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.